# 07. කච්චි තෙ කස්සප

## සත්තමො පාඨො



කච්චි තෙ **කස්සප** ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි දුක්ඛා වෙදනා පටික්කමන්ති නො අභික්කමන්ති පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමොති? න මෙ **භන්තෙ** ඛමනීයං; න යාපනීයං; බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති; අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

සත්තිමෙ **කස්සප** බොජ්ඣඞ්ගා මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති.

**(මහාකස්සපත්ථෙරබොජ්ඣඞ්ගසුත්තං)**

## වචන මාලාව

1. කච්චි - කිමෙක් ද?
2. ඛමනීයං - ඉවසිය හැකි
3. යාපනීයං - යැපිය හැකි
4. පටික්කමන්ති - උවදුර (රෝගය)
5. අභික්කමන්ති - (රෝගය) වර්ධනය වේද
6. බාළ්හා - දැඩිව
7. සම්මදක්ඛාතා - මැනවින් කියන ලද
8. භාවිතා - වඩන ලද
9. බහුලීකතා - බොහෝ සෙයින් පුරුදු කරන ලද
10. අභිඤ්ඤාය - විශිෂ්ට ඤාණයෙන් දැනගැනීම පිණිස
11. සම්බෝධාය - අවබෝධය පිණිස
12. සංවත්තන්ති - පවතිත්

## ආලපන විභක්තිය

- කච්චි තෙ <u>**කස්සප**</u> ඛමනීයං?

  (කාශ්‍යපය, කිම ඔබට ඉවසිය හැකි ද?)
- න මෙ <u>**භන්තෙ**</u> ඛමනීයං.

  (ස්වාමීනි, මට ඉවසිය නො හැකි ය.)

බුදුරජාණන් වහන්සේ මහාකාශ්‍යප තෙරුන්ට ඇමතීම සඳහා මෙහි <u>**කස්සප**</u> යන පදය යොදා ගෙන ඇත. එසේ ම දෙවැනි වාක්‍යයෙහි <u>**භන්තෙ**</u> යනුවෙන් මහාකාශ්‍යප තෙරණුවෝ බුදුරදුන් අමතති. මෙසේ කෙනෙකු ඇමතීම සඳහා ආලපන විභක්තියේ පද අපි භාවිත කරමු.

**පහත උදාහරණ බලන්න.**

- හෙ දෙව - පින්වත් දෙවිය,
- හෙ මනුස්ස - පින්වත් මිනිස,
- හෙ අස්ස - එම්බා අශ්වය,
- භවන්තො සිස්සා - පින්වත් ශිෂ්‍යයිනි,
- භවන්තො ආචරියා - පින්වත් ගුරුවරුනි,

**ආලපන විභක්තියේ නාම වරනැගෙන අයුරු බලන්න.**

| ආලපන විභක්තිය | | |
|---|---|---|
| **නාමය** | **ඒක වචන** | **බහු වචන** |
| බුද්ධ | (හෙ) බුද්ධ, බුද්ධා | (භවන්තො) බුද්ධා |
| අග්ගි | (හෙ) අග්ගි, | (හෙ) අග්ගී, අග්ගයො |
| දණ්ඩී | (හෙ) දණ්ඩී | (හෙ) දණ්ඩී, දණ්ඩිනො |
| භික්ඛු | (හෙ) භික්ඛු | (භවන්තො) භික්ඛූ, භික්ඛවෙ, භික්ඛවො |
| කඤ්ඤා | (භොති) කඤ්ඤෙ | (භොති) කඤ්ඤා, කඤ්ඤායො |
| නදී | (භොති) නදී | (භොති) නදී, නදියො, නජ්ජො |
| චිත්ත | (හෙ) චිත්ත, චිත්තා | (හෙ) චිත්තෙ, චිත්තානි |

ආලපන විභක්ති පද භාවිත කොට සාදා ඇති මෙම වාක්‍ය බලන්න.

- **හෙ මිත්ත, ඉධ ආගච්ඡසි.**- පින්වත් මිත්‍රය, මෙහි එන්න.
- **හෙ පුරිස, ත්වං ආගච්ඡසි.**- පින්වත් පුරුෂය, ඔබ එන්න.
- **භවන්තො සිස්සා, තුම්හෙ ලිඛථ.**- පින්වත් සිසුනි, ඔබලා ලියවු.

## අභ්‍යාසය 07 1

1. සිංහලට නගන්න.
    1. හෙ කුමාර, ඉධ තිට්ඨසි.
    2. හෙ භූපාල, ත්වං ඉතො නික්ඛම.
    3. හෙ ආනන්ද, කො අයං?
    4. හෙ ආචරිය, අයං පදීපො.
    5. භවන්තො කුමාරා, තුම්හෙ ධාවථ.
2. පාලියට නගන්න.
    1. පින්වත් කුමාරය, ඔබ කවරෙක් ද?
    2. පින්වත් යහළුව, මම සෝරත.
    3. එම්බා අශ්වයිනි, තොපි දුවවු.
    4. පින්වත් මහ ඇමතිතුමනි, හිඳගන්න.
    5. එම්බා සේවකය, මෙතැනින් යන්න.
3. ආලපන විභක්ති පද යොදා ඔබ කැමති වාක්‍ය පහක් නිර්මාණය කරන්න.
4. ඔබ කැමති නාම දහයක් ආලපන විභක්ති රූපයෙන් ලියන්න.

**මෙම ශබ්දය වාචෝද්ග්‍රහණය කරන්න.**

| ඉකාරාන්ත පුල්ලිඞ්ග "අග්ගි" ශබ්දය (ගිනි) | | |
|---|---|---|
| **විභක්තිය** | **ඒකවචන** | **බහුවචන** |
| **පඨමා** | අග්ගි | අග්ගී, අග්ගයො |
| **ආලපන** | (හෙ) අග්ගි | (හෙ) අග්ගී, අග්ගයො |
| **දුතියා** | අග්ගිං | අග්ගී, අග්ගයො |
| **තතියා** | අග්ගිනා | අග්ගීහි, අග්ගීභි |
| **කරණ** | අග්ගිනා | අග්ගීහි, අග්ගීභි |
| **චතුත්ථී** | අග්ගිනො, අග්ගිස්ස | අග්ගීනං |
| **පඤ්චමී** | අග්ගිනා, අග්ගිම්හා, අග්ගිස්මා | අග්ගීහි, අග්ගීභි |
| **ඡට්ඨී** | අග්ගිනො, අග්ගිස්ස | අග්ගීනං |
| **සත්තමී** | අග්ගිම්හි, අග්ගිස්මිං | අග්ගිසු, අග්ගීසු |